# ලෝක සාමය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරීත්වය

ඊ.එම්.එස්.එම්. ප්‍රේමරත්න[15]
කේ.පී.එන් තරංගනී[16]

## සංක්ෂේපය

ජාත්‍යන්තර සංවිධාන අතුරින් ඉතා වැදගත් සංවිධානයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දිය හැකිය. ජාතික සාමය හා ආරක්ෂාව සුරක්ෂිත කිරිම සඳහා කටයුතු කළ ආකාරය පිළිබඳ අධ්‍යයන කිරීම මෙහි මූලික අරමුණයි. එමෙන්ම ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය භාවිතා කළ උපක්‍රම වල ස්වභාවය පිළිබඳ විමසා බලනු ලැබේ. මෙහිදී ද්විතියීක දත්ත රැස් කරගන්නට වූ අතර අධ්‍යයන ක්‍රමවේදය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදි. මෙහි නිගමනය ලෙස දැක්විය හැක්කේ, යම් යම් ඌණතා පැවතිය ද, අද වන විට ද ලෝක සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම උදෙසා එක්සත් ජාතීන්ගේ සංවිධානය සුවිශාල කාර්යභාරයක් ඉටු කරන බවයි.

**මුඛ්‍ය පද:** *එක්සත් ජාතීන්ගේ සංවිධානය, සාමය, සුරක්ෂිතතාව, ආරක්ෂාව*

## හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය නමින් ක්‍රි.ව 1943දි ටෙහෙරාන් නුවරදී බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ප්‍රැන්ක්ලින් රූස්වේල්ට් හා සෝවියට් රුසියාවේ නායක ජෝසප් ස්ටාලින් යන බලවතුන් තිදෙනා විසින් පවත්වන ලද සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ලෝකය තුල සාමය පවත්වා ගෙන යාම සඳහා සංවිධානයක් පිහිටුවා ගත යුතු යැයි යෝජනා ඉදිරිපත් විය. එම යෝජනාව මූලික කරගත් ප්‍රතිපත්ති මාලාවක් ක්‍රි .ව. 1945 සැන් ප්‍රැන්සිස්කෝ සමුළුවේ දි සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්ති මාලාව රටවල් 50ක් අනුමත කිරිමෙන් පසුව ක්‍රි..ව. 1945 ඔක්තෝම්බර් 24 වන දින ඇමෙරිකානු එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර මූලස්ථානය කර ගනිමින් ලොව විශාලතම ජාත්‍යන්තර සංවිධානය වන එක්සත් ජාතින්ගේ සංවිධානය(united national organization) ආරම්භ කරන ලදී. ඒ අනුව එතැන් සිට ඔක්තෝම්බර් 24 වන දින එක්සත් ජාතින්ගේ දිනය ලෙස නම් කොට ඇත.

## එක්සත් ජාතින්ගේ සංවිධානය බිහිවීමට පදනම් වූ සාධක

පළමු වන ලෝක සංග්‍රාමයට පසු නැවතත් එවන් විපතක් ලොව ඇති නොවීමේ අරමුණින් සංවිධානයක් බිහි කර ගන්නා ලදී. එම සංවිධානය ජාතීන්ගේ සංවිධානය ලෙස සැලකේ. කෙසේ නමුත් මෙම සංවිධානය තුළ තිබූ දුර්වලතා හේතුකොටගෙන දෙවන ලෝක සංග්‍රාමය හට ගන්නට විය. ඉන් පසුව නැවත එවන් විපතක් සිදු නොවීම උදෙසා මහා බලවතුන් වූ බ්‍රිතාන්‍ය අගමැති වින්සන් චර්චිල්, ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ප්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් සහ සෝවියට් රුසියාවේ නායක ජෝසප් ස්ටාලින් යන ලෝක බලවතුන් තිදෙනා විසින් සාකච්ඡා පවත්වන ලදි. එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ලෝක සාමය සුරක්ෂිත කරගෙන පවත්වා ගෙනයාම සඳහා ජගත් සංවිධානයක් පිහිටුවා ගැනිමට යෝජනා කරන ලදී. එසේ යෝජනා සම්මත කර ගැනීමෙන් අනතුරුව 1945 ජුනි මස 28වන දින එම නියෝජිත පිරිස විසින් එක්සත් ජාතීන්ගේ

[15] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) ප්‍රථම වසර


[16] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) ප්‍රථම වසර

ප්‍රඥප්තියට අත්සන් තබන ලදී. මේ අනුව චීනය, ප්‍රංශය, සෝවියට් දේශය, බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය වැනි බලවත් රටවල් ඒකමතික තීරණයෙන් අත්සන් තබා 1945 ඔක්තෝබර් 24 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලදී. මෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උදෙසා ව්‍යවස්ථා 111කින් යුතු ප්‍රඥප්තියක් සම්මත කර ගෙන තිබේ. එමෙන්ම මෙම සංවිධානය පිහිටුවා ගැනීමේ පරමාර්ථ මෙසේ ගොනු කර දැක්විය හැක. එනම් ජාත්‍යන්තර සාමය හා ආරාක්ෂාව පවත්වා ගෙන යාම, ජාතීන්ගේ නිදහස ගරු කිරීම තුළින් සුහදතාවය වර්ධනය සහ ලෝක සාමය තහවුරු කිරිම, ආර්ථික, සමාජීය, සංස්කෘතික හෝ මානුෂික වු ජාත්‍යන්තර ගැටළු විසඳීමේ අරමුණ ඉටු කර ගැනීම, ලෝක සාමය සුරක්ෂිත කරලීම සඳහා මෙය පිහිටුවන ලදි. මෙම සංවිධානයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 192 කි (විජේසිරි, 2013 , 116).

## එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනික ව්‍යුහය

මෙම සංවිධානයේ ව්‍යුහය පිළිබඳව කෙටියෙන් ව්‍යුහය පිළිබදව විමසා බැලිමේදි මෙම සංවිධානය ආයතන 06කින් සමන්විත විය. එම ආයතනික ව්‍යුහය හා එම ආයතනවල කාර්යභාරය සැකවින් පහතින් දක්වා ඇත.

රූප සටහන 01: එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනික ව්‍යුහය




Source: www.uno.org

**මහා මණ්ඩලය**

එක්සත් ජාතීන්ගේ සියළු සාමාජික රටවල නියෝජිතයින් මෙම ව්‍යුහයට ඇතුලත් වේ. මහා මණ්ඩලයේ කාර්යයන් කිහිපයකි. එනම් නිරායුධකරණය, අවි සීමාව, ජාත්‍යන්තර සාමය ආරක්‍ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සකච්ඡාව හා නිර්දේශ කිරීම, ආරක්‍ෂක මණ්ඩලය ප්‍රමුඛ සෙසු ආයතන වාර්තා ලබා ගැනීම හා ඒවා විමසීම සිදු කරයි. ඊට අමතරව මහා ලේඛම්වරයා පත් කිරිම සිදු කරනු ලබන අතර සැසි වාර සඳහා සභාපති ද, පත් කරයි.

**ආරක්‍ෂක මණ්ඩලය**

මෙහි සාමාජික සංඛ්‍යාව 18ක් වන අතර එහි සංයුතියේ මහා බලවතුන් 05 දෙනෙකි. එනම් ඇමරිකාව, බ්‍රිතාන්‍ය, චීනය, ප්‍රංශය හා රුසියාවයි. ඉතිරි 10 දෙනා මහා මණ්ඩලය වසර 02ට පත් කරයි. ආරක්‍ෂක මණ්ඩලය මගින් සංගමයේ ප්‍රතිපත්ති හා පරමාර්ථවලට අනුව අන්තර් ජාතික සාමය හා ආරක්‍ෂාව සැලසීම, අවි සීමා කිරීම., ආර්ථික තහංචි පැනවීම හා ආක්‍රමණික ක්‍රියාවලට

එරෙහිව පියවර ගැනීම යන කාර්යයන් ඉටු කරයි. සටන් විරාමවලට අනුබල දීම, සාම හමුදා අදාළ ප්‍රදේශ කරා යැවීම වැනි ක්‍රියාමාර්ග ද, අනුගමනය කරයි. මෙම ආයතනයේ සුපිරි බලවතුන් වන ඇමරිකාව සහ රුසියාව තමන්ට පක්‍ෂපාතී රටවල් ආරක්‍ෂා කිරීමට නිශේධ බලය යොදා ගනී.

### ආර්ථික හා සමාජීය මණ්ඩලය

මෙම ආයතනයේ වැඩ කටයුතු කොමිෂන් සභා මගින් සිදු කරයි. එක්සත් ජාතීන් සතු විශේෂඥ මණ්ඩලවල දැනුම ඒකාබද්ධව යොදා ගන්නේ මෙම මණ්ඩලයයි. ලෝකයේ අන්තර් ජාතික වැදගත්කමක් ඇති ආර්ථික, සමාජීය ගැටළුවලට පිළියම් යෝජනා කිරීම, මානව අයිතිවාසිකම් පිළිබඳ සුපරීක්‍ෂාකාරී වීම, ලෝකවාසීන් දැනුවත් කිරීම මෙම මණ්ඩලයේ කාර්යය වේ .

### භාරකාර මණ්ඩලය

මේ සතු කාර්‍යයභාරය වුයේ, භාරකාර ක්‍රමයට නතුවන ප්‍රදේශ පාලනය කිරීමයි. එම ප්‍රදේශයේ මහජන යහපත ස්වාධීනතාව ලඟා කරදීම මෙහි ප්‍රධාන අරමුණකි. මෙහි සමාජිකත්වය සුපිරි බලවතුන් 05 දෙනා දරනු ඇත.

### අන්තර් ජාතික අධිකරණය

මෙහි මුලස්ථානය පිහිටා ඇත්තේ හේග් නුවරය. ඕනෑම රාජ්‍යයකට සිය ආරාවුල් පිළිබඳ අන්තර් ජාතික අධිකරණයට කරුණු ඉදිරිපත් කළ හැක. යම් රාජ්‍යයක් අධිකරණ තීරණ පැහැර හැරියොත් දඩුවම් කිරීමට හැකියාවක්, නොමැත. මේ හේතුවෙන් අධිකරණයේ නඩු විසඳා ගැනිමට එන රටවල් එකී තීරණ පිළිගන්නා බවට ප්‍රතිඥා දිය යුතුය.

### මහා ලේඛම් කාර්යාලය

මෙහි ප්‍රධානියා වන්නේ මහා ලේඛම්වරයාය. ඔහු සියළුම ආයතනවල පරිපාලන නිළධාරියා වන්නේය. මහ මණ්ඩලයේ මහ බලවතුන්ගේ එකගත්වයෙන් ඔහු පත් කරයි. මහ ලේඛම්වරයා ලොව සාමය කඩකිරීම් මහා මණ්ඩලයේ අවධානයට ලක් කිරීම හා ජාත්‍යන්තර හමුදා කටයුතු වල වගකිම් හා අධීක්‍ෂණය භාර අවසාන පාලකයා විය. එසේම, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සම්බන්ධ විශේෂිත ආයතන 28ක් ද, සෙසු කොමිසන් සභා 4ක් ද, භූගෝලීය වශයෙන් කලාප 05ට බෙදන ලද කොමිසන් සභා 05ක් ද, ඇත (විජේසිරි, 122).

## එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය

එක්සත් ජාතීන්ගේ සංවිධානයට ආරම්භක අවධියේ දී පුළුල් කාර්යය භාර්යයක් හිමි විය. එනම් ජාත්‍යන්තර ආරක්ෂාව හා සාමය පිළිබඳ කටයුතු, ආර්ථික හා සාමාජීය සංවර්ධනය සඳහා වූ කටයුතු, මිනිස් අයිතිවාසිකම් සඳහා වූ කටයුතු, යටත් විජිතවාදය පිටු දැකීම් සඳහා වූ කටයුතු, ජාත්‍යන්තර නීතිය සඳහා කටයුතු . ඒ අතර ප්‍රධාන වේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රියා කළ ආකාරය දැකගත හැකිය. නමුදු මෙම ලිපිය තුළින් අපේක්ෂා කරන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව හා සාමය ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ ආකාරය පිළිබඳවය (විජේසිරි, 2013, 127).

දේශපාලන බෙදීම් මුල් කරගෙන සුපිරි බලවතුන්ගේ බිහිවීමත් ඔවුන්ගේ බල තුලන ක්‍රියාවලිය හමුවේ ලෝක සාමය සුරක්ෂිත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් විය. විශේෂයෙන් මෙම සංවිධානය 1950 කොරියානු අර්බුදය, 1947 බර්ලිනය අර්බුදය, 1956 සූවස් අර්බුදය, 1962 කියුබානු මිසයිල අර්බුදය, 1960 කොංගෝ අර්බුධය සඳහා මැදිහත් විය. .මෙම අර්බුධ පිළිබඳව කෙටියෙන් විමසා බැලිය යුතුය. ඒ අනුව කාශ්මීර අර්බුධය ගැන විමසා බලන විට කාශ්මීරය ඉන්දියාවට අයත් වීමෙන් පාකිස්ථාන ජල පෝෂක ප්‍රදේශ අහිමි වන බව කියමින් පාකිස්ථානය මැදිහත් විය. එහි දී ඉන්දියාව එක්සත් ජාතීන්ගේ සංවිධානයට මේ ගැටලුව

යොමු කරන අතර පාකිස්ථානය ඉන්දියාවට චෝදනා කරමින් කියා සිටියේ එම ප්‍රදේශය පාකිස්ථානයට අයත් වන බවයි. මෙහිදී එක්සත් ජාතීන්ගේ සංවිධානය කොතෙක් දුරට මැදිහත් වූයේ ද, යත් ආරක්ෂක මණ්ඩලයේ තීරණය වූයේ මෙම ප්‍රශ්නයට දෙරටටම උදව් කිරීමට මැදිහත් විය යුතුය යන්නයි. ඒ සඳහා 1948 ජූලි මස එක්සත් ජාතීන්ගේ සංවිධානය කොමිසමක් පත් කරන ලදි. සටන් විරාමයක් ක්‍රියාත්මක කල අතර ජනමත විචාරණයක් ද, පවත්වා ජනතාවගේ අදහස් ලබා ගන්නා ලදි. නමුත් එය කාලයත් සමඟ නැවත මතභේදයට ලක් විය. 1957- 1964 කාලයේ කාශ්මීර ප්‍රශ්නයට විසඳුම් දීමට බටහිර රටවල් ගත් උත්සාහය නිශ්ඵල විය. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංගමයට ඉදිරිපත් කළත් ප්‍රශ්නයට විසඳුම් ලබාදීමට නොහැකිව තිබේ. ඉන්දු පාකිස්ථාන් සටන් උග්‍ර වීමේදි නිරීක්ෂක කණ්ඩායම් යෝජනා ඉදිරිපත් කරන ලදි. සෑම අවස්ථාවකදීම සටන් නතර කරන ලෙසින් නියෝග නිකුත් කළත් එයට ප්‍රතිචාරය වූයේ, තවදුරටත් එය පැවතිය යුතු බවයි. 1971 මහ ලේඛම්වරයා ප්‍රකාශ කළේ ලෝක සාමයට හා ආරක්ෂාවට තර්ජනයක් වන අයුරින් කාශ්මීර අර්බුදය පිරිහෙමින් පවතින බවයි. 1972 ජූලි 02 පකිස්ථාන් ජනාධිපති අලි භූතෝ සහ ඉන්දීය අගමැතිනි ඉන්දිරා ගාන්ධි විසින් අත්සන් කළ සිම්ලා ගිවිසුම අනුව ද, දෙපිරිසම අකමැති වූ නිසා කාශ්මීරය බෙදා වෙන් කරන ලදී. වර්තමානය වනවිට මේ ප්‍රශ්ණය උග්‍ර වී පවතී. එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා නොදීම නිසා මෙය තවදුරටත් නොවිසඳුණු ප්‍රශ්නයක් වේ. (පතිරණ , 2008)

එක්සත් ජාතීන්ගේ සංගමය ආරම්භයේ සිටම කොරියානු අර්බුදය කෙරෙහි අවධානය යොමු කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය පළමු වරට සාමුහික ආරක්ෂාව යොදා එක්සත් කොරියාවක් වෙනුවෙන් ක්‍රියා කිරීම සිදු කරන ලදි. 1948දී කොරියාව උතුරු සහ දකුණු කොරියාව ලෙස වෙන් වීමත් සමඟ එය ව්‍යාර්ත විය. දකුණු කොරියාව පිහිටුවීමේ දී ජනමත විචාරණයක් පැවැත්වූයේ එක්සත් ජාතීන්ගේ මුලිකත්වයෙනි. කෙසේවෙතත්, පසුකාලීනව උතුරු කොරියානු හමුදාව දකුණු කොරියාව ආක්‍රමණය කිරීම ආරක්ෂක මණ්ඩලය හෙළා දැක උතුරු කොරියන් හමුදාව උතුරු අක්ෂාංශ 38 රේඛාවෙන් උතුරට කැඳවා ගන්නා ලෙස නියෝග කළේය. එය ඉටු නොවීම නිසා සාමය ආරක්ෂා කිරීම පිණිස සාමාජික රටවල සහය දකුණු කොරියාවට ලබා දෙන ලෙස ආරක්ෂක මණ්ඩලය ඉල්ලීමක් කලහ. එයට ප්‍රතිචාර ලෙස යුධ හමුදාවක් එක්සත් ජනපදය විසින් ලබා දෙන ලදි. මේ ප්‍රශ්නය විසඳීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නිත්‍ය නේවාසික කොමිසම පත් කර කොරියාවට යවන ලදි. උතුරු හා දකුණු කොරියා රාජ්‍යන්ගේ අදහස වූයේ බටහිර බලපෑම් වලින් තොරව රාජ්‍ය 2ම එක්සත් විය යුතු බවත්, එය සාමකාමීව සිදුවිය යුතු බව සහ ජාතික එක්සත් බව දියුණු කල යුතු බවත්ය.. මෙසේ කොරියානු ප්‍රශ්නය දිගටම තිබියදි එක්සත් ජාතීන් සාකච්ඡා පමණක් පවත්වන ලදි. මෙසේ එක්සත් ජාතීන්ගේ සංවිධානය සාමය සුරක්ෂිත කිරීමට කටයුතු කළ ද, තවමත් දෙරට ලෝක දේශපාලන තත්ත්වය තුළ ගැටුම් පවතින අතර එම ගැටුම් විසඳා ගැනීමට හැකියාව නොලැබ තිබේ.

1960 ජූලි 30 වන දින තෙක් කොංගෝව බෙල්ජියම් යටත් විජිතයක් බවට පත්ව තිබුණි. කොංගෝව නිදහස ලබන විට අප්‍රිකාවට වඩා ආර්ථිකය අතින් ඉහල මට්ටමක තිබුණි. එහෙත් බෙල්ජියානු රජය 1960දී කොංගෝ ස්වදේශ නායකයන් කොංගෝවට ස්වාධීනත්වය ප්‍රධානය කිරිමට කැමැත්ත ප්‍රකාශ කරන ලදි. විශේෂයෙන් කොංගෝවට ප්‍රමාණවත් පරිදි ආධාර ලබා දෙන ලෙස එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 99 වන වගන්තිය අනුව ආරක්ෂක මණ්ඩලය මහ ලේඛම්වරයාට දන්වන ලදි. මෙය එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් වලින් දෙවැනි වන්නේ කුවේට ඉරාක අර්බුදයට පමණි. කොංගෝවේ දේශපාලන ස්වාධිනත්වය මෙන් ම භෞමික අඛණ්ඩතාවයක් ආරක්ෂා කිරීමට අමතරව විවිධ සේවා අංශ සහ තාක්ෂණික සේවා සැපයීමට ද එක්සත් ජාතීන්ගේ හමුදාවන්ට සිදු විය. එසේ වුවත් කොංගෝව තුළ පැවැති ආරාජිකත්වය සමනය කරනු පිණිස විවිධ රටවල විශේෂඥයින් 2000ක් පමණ සේවයේ යොදවා කොංගෝ රජයට එක්සත් ජාතීන්ගේ සංවිධානය සහය දක්වන ලදි. කියුබානු මිසයිසල අර්බුදය ද, එක්සත් ජාතීන්ගේ මහා ලේඛම්ගේ පෞද්ගලික මැදිහත් වීම තුළින් විසඳන ලදී.(පතිරණ , 2008, පිටු අංක 136)

## නිගමනය

20 වන සියවසේ මුල පටන් ලෝක සාමය හා ආරක්ෂාව උදෙසා ඇති කරගත් සම්මුතියෙහි ප්‍රතිඵලයක් ලෙස 1 වන ලෝක සංග්‍රාමය අවසානයේ දි ජාතීන්ගේ සංගමයත් දෙවන ලෝක සංග්‍රාමය අවසානයේ එක්සත් ජාතීන්ගේ සංග්‍රාමය අවසානයේ දී ජීවිත හා දේපල ආරක්ෂා කර ගැනිමේ මිත්‍ර පාක්ෂික නායකයන් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි කරගන්නා ලදී. ලෝක සාමය සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරි කොට ගෙන පිහිටුවා ඇති මෙම සංවිධානය ලෝක සාමය සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කරන ලදි. මෙම සංවිධානය ආරම්භයේ බල කඳවුරු 2ක බල තරගයක් ඇතිවීම නිසා තම අරමුණු ඉටු කර ගැනීමට නොහැකි විය.. එක්සත් ජාතීන්ගේ සාම ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කිරිමේදී පෙනී යන්නේ ඒකපාර්ශවිය නොවූ සාධාරණ තීරණ ගැනීමට නොහැකි වූ බවයි. උදාහරණ ලෙස කාශ්මීර අර්බුදය වැනි අවස්ථාවලදී ස්ථිර විසඳුම් ලබා දීමට නොහැකි වී තිබෙන අතර ප්‍රශ්නය උඩු දුවමින් පවති. කොරියානු අර්බුදයේ දී තාවකාලිකව රටවල් වෙන් වුවත් රටවල් දෙකම ස්වාධිනව කටයුතු කිරීම නිසා එය එක්සත් ජාතීන්ගේ සංවිධානයට එතරම් බාධාවක් නොවිය. විශේෂයෙන්ම කොංගෝ අර්බුධයේ දී පැහැදිලි වුයේ කුඩා රාජ්‍යයන්හි ස්වාධිනත්වය තහවුරු වු බවයි. කියුබානු අර්බුදය මුළුමනින්ම විසඳා ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉවහල් විය. ඒවාගේම මෙම සංවිධානයට අනුබද්ධිත ලෝක සෞඛ්‍ය සංවිධානය, ජාත්‍යන්තර ළමා අරමුදල, සරණාගතයින් පිළිබඳ මහා කොමසාරිස් කාර්යාලය වැනි සංවිධාන ලෝක සාමයට හා සංවර්ධනයට කරනු ලබන කාර්ය ඉතා විශාලය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියේ එක් වගන්තියක සාමය ආරක්ෂා කිරීමට හා යුද්ධ නොකිරීමට ප්‍රතිඥා දී තිබුණත් තවත් වගන්තියක යම් රාජ්‍යකට එරෙහිව ගුවනින් හා මුහුදෙන් පහර දීම කළ හැකි බව පවසා තිබීම ව්‍යවස්ථා විරෝධි වේ. කෙසේවෙතත්, ලොව පුරා ප්‍රදේශ 22ක ගැටුම් වළක්වා සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායම් සාමය සුරක්ෂිත කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ. මෙම රටවල් අතර අර්බුධ නිසා සාම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපහසු වි තිබේ. එයට හේතුව මූල්‍ය ආධාර නොලැබීමයි. කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට ප්‍රකාරව එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ලෝක සාමය හා ආරක්ෂාව තහවුරු කිරීමයි. සෑම සාමාජික රාජ්‍යයක්ම ඒ සඳහා බැඳී පවතී. එහෙත් කිසිඳු රාජ්‍යක් තම අරමුණ අභිබවා යාමට අකැමැතිය. එම නිසා ලෝක සාමය පවත්වා ගැනිම අපහසු වී තිබේ. නමුත් තාක්ෂණික දියුණුව හා වෙනත් හේතු පදනම් කරගෙන තෙවන යුද්ධයක් ඇති වීමට තිබූ ඉඩකඩ අවම වී තිබේ. ජාත්‍යන්තර දේශපාලනය ස්ථාවර විමටත් ලෝක සාමය හා ආරක්ෂාව තහවුරු කර ගැනීමටත් මෙතෙක් බිහි වූ සංවිධාන අතුරින් අග්‍රගණ්‍ය සංවිධානයක් ලෙස අවසාන වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දිය හැකිය..

## ආශ්‍රිත ග්‍රන්ථ


කරුණාදාස, ඩබ්ලිව්. එම්., 2006. *ජාත්‍යන්තර සංවිධාන* , දෙහිවලː ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

කුමාර පි. එස්., 2006, *අන්තර්ජාතික සංවිධාන.* කොළඹ ː සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, කරුණාරත්න., 2000. *ලොව ජගත් සංවිධාන*

ඩයස්, නොයෙල්, 2000. *ජාත්‍යන්තර තුලනාත්මක හා මානව හිමිකම් පිළිබඳ නිතිය,* කොළඹː කොළඹ විශ්ව විද්‍යාලය

පතිරණ එස්. එස්., 2008, *එක්සත් ජාතීන්ගේ සාම ක්‍රියාවලිය*, කැලණියː සරසවි ප්‍රින්ටර්ස්

මලාන්සුන්, පීටර්., 2002. *ඇන්හර්ස්ට්ගේ නූතන ජාත්‍යන්තර නීති ප්‍රවේශය* , කොළඹ 10ː ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

විජේසිරි, ඊ. ජී., 2013. *අන්තර්ජාතික දේශපාලනය,* වැල්ලම්පිටියː චතුර මුද්‍රණාලය
සෙනෙවිරත්න, චාමින්ද., 2002. *ලෝක සංවිධාන*, කොළඹː ඇම්.ඩි ගුණසේන හා සමාගම
www.un.org